**තයාග හා දිරිදීමනා අරමුදල - 2015**

**--------------------------------------------**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තයාග හා දිරිදීමනා අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 8 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද මෝටර් රථ ප්‍රවාහන පනතේ (203 අධිකාරය) 213 ඇ (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සංචිත සඳහා වෙන්කිරීම්, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත්, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සංචිත සඳහා වෙන්කිරීම් පිළිවෙලින් රු. 4,232,599 ක් සහ රු. 5,792,890 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල වියදමක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කර තිබූ අතිරික්ත පිළිවෙලින් රු. 4,232,599 කින් සහ රු. 5,792,890 කින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල පිළිවෙලින් රු. 7,059,901 ක් හා රු. 11,490,009 ක් ලෙස දක්වා තිබූ අතර බැංකු තහවුරු ලිපි අනුව නිවැරදි වටිනාකම පිළිවෙලින් රු. 7,099,095 හා රු. 11,462,147 විය යුතුව තිබුණි.

### 2.3 ගෙවිය යුතු ශේෂ

2014 හා 2015 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 6,160,646 ක් හා රු. 1,273,712 ක්වූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ආපසු ගෙවිය යුතු එකතුව රු. 7,434,358 ක මුදලක් 2016 මැයි 13 දින වනවිටත් ආපසු ගෙවා නොතිබුණි.

### 2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (අ) 03.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට කටයුතු කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට රු. 15,404,676 ක අතිරික්ත මුදල් සම්බන්ධයෙන් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 04.2 (ඇ) ඡේදය | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් සහ පොත්පත් පවත්වාගෙන යන්නේ නම් එම ගිණුම් සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවත්, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 04.3 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ 2015 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක්ද සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 (ඇ) උපඡේදය අනුව සියළුම දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කිරීම් කලයුතු වුවත් ඊට පටහැනිව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සකස් කල ක්‍රමවේදයකට අනුව කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ එම වියදම රු. 108,726,084 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය සංචිත අරමුදලට වෙන් කිරීමට පෙර රු.8,825,357 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 11,458,547 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,633,190 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ආදායම රු. 24,995,943 කින් හෙවත් සියයට 28 කින් වැඩිවී තිබුණද, දිරිදීමනා ගෙවීම් රු.28,181,091 කින් හෙවත් සියයට 35 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහල නැංවීමේ සහ මෝටර් රථ ප්‍රවාහන පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය නිසි ලෙස අභිප්‍රේරණය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණ වන අතර ඒ වෙනුවෙන් පහත සඳහන් ගෙවීම් කල හැකිය.

(අ) අනුමැතිය ලබාගැනීමෙන් තොරව යම් මෝටර් රථයක් වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන හා පසුව නඩු පැවරීම සිදුකරනු ලැබිය හැකි වූ සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම හා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන් සඳහා ගෙවීම.

(ආ) කාර්ය මණ්ඩලයට ගෙවීමට නියමිත දිරි දීමනා; පුහුණු හා අධ්‍යාපන කටයුතු; ක්‍රීඩා, විනෝද හා සුභසාධන කටයුතු සඳහා ගෙවීම.

(ඇ) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නාවූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ගෙවීම හා අරමුදලේ පරිපාලන වියදම් සඳහා ගෙවීම.

එහෙත් සමාලෝචිත වර්ෂය තුළ දී මෝටර් රථයක් වෙනස් කිරීම පිළිබඳ තොරතුරු සැපයීම, සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම හා අනාවරණය කර ගැනීමට, කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා විනෝද හා සුභසාධන කටයුතු සඳහා ගෙවීම, පුහුණු හා අධ්‍යාපන කටයුතු හා ප්‍රශංසාත්මක හා විශේෂ ඇගයීම් සඳහා විධිමත් වැඩපිළිවෙලක් අරමුදල විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත වියදම් තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 07 ක සියයට 46 සිට සියයට 100 දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමසාරිස් ජනරාල් වෙත වරින්වර යොමු කරන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට හා ගිණුම්කරණ මූලධර්ම වලට අනුගත වීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතුය.